# ලංකා සෝල්ට් ලිමිටඩ්

## ඇබෑර්තු

SLS ප්‍රමිති සහතිකය සහ ISO 9001:ISO 22000 ජාත්‍යන්තර තත්ව සහතිකවලින් පිදුම් ලද ලංකාවේ ප්‍රධානතම ලුණු නිෂ්පාදකයා වන ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනය පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයගෙන් සේවාවන් ලබාගැනීමට බලාපොරොත්තු වේ.

සුදුසු අයදුම්කරුවන් හට පිළිගත් ආයතනයක/ සංවිධානවල අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව පළපුරුද්ද තිබිය යුතු අතර, ඔහු/ ඇය ක්‍රියාකාරී හා කාර්යශූර හා බුද්ධිමත් අයෙකු විය යුතුය.

## ප්‍රසම්පාදන කළමනාකරණ තනතුර - MM1-1

**රැකියා පැතිකඩ** : වගවීම් ප්‍රධාන වපසරිය

ප්‍රසම්පාදන අංශයේ ප්‍රධානී වශයෙන් කොට්ඨාසයේ අරමුණු සපුරා ගැනීම උදෙසා තම රාජකාරි කාර්යක්ෂමව ඉටුකිරීම ප්‍රසම්පාදන අංශයේ සියලු ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම හා සම්බන්ධීකරණය කිරීම සහ කාර්ය මණ්ඩලය අධීක්ෂණය කිරීමද කළ යුතුය.

**පත්වීමේ ස්වභාවය** : මෙය කොන්ත්‍රාත් තනතුරක් වන අතර, ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනයේ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා අයට හිමි වරප්‍රසාද සියල්ල මෙම තනතුරට ද හිමි වේ.

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්:**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් කළමනාකරණය පිළිබඳ උපාධියක් වාණිජ B.Sc (රාජ්‍ය/ ව්‍යාපාර) පරිපාලනය හෝ ඕනෑම ධාරාවකින් සහ සැපයුම්දාම කළමනාකරණය/ ප්‍රසම්පාදනය පිළිබඳ පළපුරුද්ද සහ සැපයුම් හා ප්‍රසම්පාදන කළමනාකරණය සඳහා වන වෘත්තීය ආයතනයකින් නිකුත් කළ සමාන සුදුසුකම් සහ

රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක සමාන තනතුරක සාධිත ක්‍රියාකාරිත්ව වාර්තා සමග මිලදී ගැනීම්/ ප්‍රසම්පාදනය පිළිබඳ විධායක මට්ටමේ අඩු තරමින් වසර 3 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

අදාළ ක්ෂේත්‍රයේ කනිෂ්ඨ විධායක (JM1-1) තනතුරක විෂයගත වපසරියක් අවම වශයෙන් වසර 03 ක සතුටුදායක සේවාවක් සහිත සහ ඉහත සඳහන් අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් සහිත සේවකයින් වීම. සහ සමාගමේ ඉලක්ක සපුරා ගැනීම සඳහා බහු ශික්ෂණ කණ්ඩායම් මෙහෙයවීම සහ මානව හා අනෙකුත් සම්පත් කළමනාකරණය කිරීමෙහිලා හැකියාවන් සහිත වීම.

**වැටුප් පරිමාණය** : MM 1-1 රු. 53,175-10x1,375-15x1,910=95,575

**වයස් සීමාව :**

වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයින්ට හා අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව අදාළ නොවේ.

ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග අයදුම්පත් සහ සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාවක් 2023 පෙබරවාරි මස 01 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කරන්න. අයදුම් කරන තනතුර ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කරන්න.

මෙම තනතුර පිරවීමේ බලය අධ්‍යක්ෂක මණ්ඩලය සතුවේ.

**සභාපති,**
**ලංකා සෝල්ට් ලිමිටඩ්,**
**මහලේවාය, හම්බන්තොට.**
**දුරකථනය : 047-2037305**